| මු.රෙ..94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි. | විදුලිය ජලය වැනි බැදීම්ගත උපයෝගි සේවාවන් සඳහා අයකරන ගාස්තු වැඩිකිරීමත්, ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි තත්ත්වයන් යටතේ මෙවැනි අවස්ථා ඇතිව තිබුනි.<br><br>එම උපයෝගි සේවාවන් භාවිතය කළමනාකරණය කිරීම මගින් එවැනි තත්ත්වයන් ඉදිරියේදී පාලනය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර තිබීම. | 2021 වර්ෂය තුල මුද්‍රණ කටයුතු සඳහා, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන වෙන් කරදී තිබූ අතර, එම සෑම වෙන් කිරීමක්ම නියමිත කාල සීමාව තුළදී සිදු කර ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.



ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| දෙවන කොටස : 79.00 | |
|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය තුල, මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරිමට අවස්ථාවක් නොතිබීම. | දෙපාර්තමේන්තුව විසින් දැනට පවත්වාගෙන යනු ලබන වෙබ් පිටුව තුල, මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරිමට අවස්ථාවක් නොතිබුනද, අලුතින් සකස් කරන ලද වෙබ් පිටුව තුල එම අවස්ථාව සඳහා කටයුතු සම්පාදනය කර ඇත. ඉදිරියේදී නව වෙබ් පිටුව ආරම්භ කිරිමට නියමිත වේ. |
| ආයතනයේ පුරවැසි / සේවා ලාභි ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබද අධික්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රම වේදයක් සකස් කර නොතිබීම. | පුරවැසි / සේවාලාභි ප්‍රඥප්තිය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කර ඇත. තවද, මහජනතාව වෙත සේවා ලබා දීමේදී පැන නගින ගැටළු සම්බන්ධයෙන් දැනුම් දීමට පිළිගැනිමේ කවුන්ටරය අසල මහජන පැමිණිලි සඳහා වෙනම පෙට්ටියක් තබා ඇත. එය සතිපතා පරික්ෂාවට ලක්වන අතර මහජන පැමිණිලි වේ නම් ඒ පිළිබඳව සොයා බලා අධීක්ෂණය කිරිමේ ක්‍රමවේදයක් ස්ථපිත කර ඇත. |
| සමස්ථ කාර්යය මණ්ඩලය ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර, ගිවිසුම් ගතව නොතිබීම. | කාර්යය සාධන ඇගයීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේකයක් ද නිකුත් කර ඇති අතර, ඒ අනුව කටයුතු සිදු කරමින් පවති. |
| සැළසුම්ගත පුහුණු අවස්ථා වලින්, ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතීම. | 2021 වර්ෂයේ සමාන්‍ය පරිදි කාර්යාල ක්‍රියාත්මක වූයේ මාස 06 ක කාල සීමාවක් පමණි. කොවිඩ් වසංගතය හේතුවෙන් නිලධාරීන් රැස්කිරිම සීමා කිරිම හා චක්‍රිය වශයෙන් සේවයට කැඳවීම හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධීකරණය අපහසු වූ බැවින් මෙම තත්ත්වය ඇති වූ අතර, මේවන විට සැළසුම්ගත පුහුණු අවස්ථාවන් 100% ම ක්‍රියාත්මක කරමින් පවතී. |
| ආයතනයේ ගිණුම් පිළිබද විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ පැවතිම. | 2021 වර්ෂයට අදාළ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ නොව තත්ත්වාගණනය කළ මතය ලෙස, ජාතික විගණන කාර්යාලය විසින් යොමු කර ඇති අංක කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021 /81 හා 2022.05.31 දිනැති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවෙන් දක්වා ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මුල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව<br>**පළමු කොටස : 89.00** | |
|---|---|
| කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග | කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
| සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | දෙපාර්තමේන්තුවේ ඇති වාහනවලින් කැබ්රථ 03 ක හැර ඉතිරි ඒවායේ අයිතිය දෙපාර්තමේන්තුවට පැවරී ඇත. අයිතිය පැවරී නොමැති වාහනවල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී. |
| වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ කොරෝනා වසංගත තත්ත්වය වරින්වර රට තුළ මතුවීම හේතුවෙන් සංචරණ සීමා පැනවීම හා සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුගතව ක්‍රියාකිරීම හේතුවෙන් විටින්විට සීමා සහිතව කාර්ය මණ්ඩලය කාර්යාල වෙත ගෙන්වා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් මෝටර්රථ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම ප්‍රමාද විය. මේවනවිට මෙම වාහනවල අපහරණ කටයුතු සිදුකර ඇත. |
| රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ 109 ,104 ,103 .හා 110ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම්වල ප්‍රමාදයක් තිබුණු අතර, මේ වනවිට එම ප්‍රමාද වූ කාර්යයන් සම්බන්ධ කටයුතු සම්පූර්ණ කරගනිමින් පවතී. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකිරීමට නොහැකි වූයේ 2021 වර්ෂයේ පැවති කොරෝනා අර්බුදය මත කාර්යාල නිතර වසා තැබීම, කාර්යමණ්ඩල කාර්යාලයට කැඳවීම සීමා කිරීම නිසා නිලධාරීන් සේවයට වාර්තා කිරීම කඩින්කඩ සිදුවීම නිසා ඉන්ධන පරීක්ෂාවන් සිදුකිරීම ප්‍රමාද වීම මත එම වර්ෂය තුළ ඉන්ධන පරීක්ෂාව සිදුවී නැත. |
| මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකරගෙන තිබුණි. | මු.රෙ.94(1) බැරකම් නොවන අතර, මු.රෙ.94(2) අනුව ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇති කරගෙන නොමැත. එනමුත් ඉතිරි ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් පිළිබඳ කටයුතු නොකිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. |
| නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන්කර ඇත. | නියමිත කාලයෙන් බැහැරව වෙනත් ආයතන වෙත ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොමැත. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2021.12.31 දිනට නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් හිඟ ණය ශේෂයන් පැවති අතර, ඉන් එක් හිඟ ණය ශේෂයක් සම්බන්ධ කටයුතු අවසන් කර ඇත. ඉතිරි ණය ශේෂය සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, ...



...නක ධර්මසේ...
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| දෙවන කොටස : 99.00 | |
|---|---|
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2021 වර්ෂය තුළ කොරෝනා වසංගත තත්ත්වය වරින්වර රට තුළ මතුවීම හේතුවෙන් සංචරණ සීමා පැනවීම හා සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුගතව ක්‍රියාකිරීම හේතුවෙන් සමූහ වශයෙන් පිරිස් ඒකරාශී කර පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කිරීමට සිදුවිය. එනමුත් 2021 වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වෙන් වූ ප්‍රතිපාදනයෙන් 70%ක් උපයෝජනය කර ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>පළමු කොටස : **92.00** | |
|---|---|
| කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග | කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
| 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු, දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි. | පිළිගනිමි. මෙම වර්ෂයේ සිට රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට පියවර ගන්නෙමි. |
| සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ ඇත. |
| සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කර ඇත. |
| වාහනයක් ගර්භිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | වාහන අපහරණය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 අනුව පත් කළ කමිටුව වෙත අදාළ තොරතුරු යොමු කර ඇත. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් (COVID) වසංගත තත්ත්වය මත මෙන්ම රජය විසින් ඉන්ධන භාවිතය සීමා කිරීම හේතුවෙන් හා QR කේතය මත ඉන්ධන නිකුත් කිරීම නිසා මෙම පරීක්ෂාවන් සිදු කිරීමට නොහැකි විය. මෙම වර්ෂය තුළදී අදාළ පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරමි. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | ඩබ්.එම්.හේරත් නිශ්ශංක මහතාගේ ණය සහ ඩී.ජී. සිරිවර්ධන මහතාගේ ණය අයකිරීම සම්බන්ධයෙන් මේ වන විට නීතිමය කටයුතු ක්‍රියාත්මක කර ඇත. |
| අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි. | එල්.ජී. වසන්ත මයා, ජී.ඒ.එල්. ප්‍රැන්සිස් මයා, පී.ඒ.එල්. සුන්දරලංගම් මයා යන අය මේ වන විට අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ගොස් ඇති අතර ඔවුන් අවුරුදු 45 න් පසු රාජ්‍ය සේවයට සම්බන්ධ වීම හේතුවෙන් ඔවුන්ගේ විශ්‍රාම වැටුප ගෙවා නොතිබුණි. මේ වන විට එය ලබා දීමට කටයුතු කරමින් පවතින බැවින් ඉන් පසු විශ්‍රාම පාරිතෝෂිකයෙන් ණය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

එල්.ජී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.



ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| දෙවන කොටස : 61.00 | |
|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසිපරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාළව ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමට අදාළව මූලික පියවර සකස් කර තිබූ නමුත් දිවයිනෙහි පැවැති කොවිඩ් වසංගත තත්ත්වය, වරින් වර බල පවත්වන ලද ඇඳිරි නීතිය සහ දැඩි සංචරණ සීමා හේතුවෙන් වර්ෂය අවසාන වනතෙක් සම්පූර්ණයෙන් නිමකරගත නොහැකි වූ අතර 2022 වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. |
| සකස් කරනලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතිකකර නොතිබුණි. | 2021 වර්ෂයේ දී රටේ පැවති කොවිඩ් (COVID) වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු අවස්ථාවන් සඳහා නිලධාරීන් පුහුණු සඳහා යොමු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ දී නිසිපරිදි ක්‍රියාත්මක කරන ලදි. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි. | මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා එළඹිය යුතු වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සකස්කර තිබූ නමුත් ගිවිසුම්ගත වීමේ දී යම් ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණදීමට සිදු වූ අතර වර්ෂය අවසාන වනතෙක් සම්පූර්ණ ලෙස ගිවිසුම්ගත වීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ නිසි පරිදි කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගත වන ලදි. |
| මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම්කර නොතිබුණි. | 2021 වර්ෂයේ 02/2018 චක්‍රලේඛයේ අංක 6.5 අනුව මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වෙත පවරා තිබුණි. එම නිලධාරිනියගේ විශ්‍රාම යාමෙන් පසු සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත පවරා ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2021 වර්ෂයේ දී රටේ පැවති කොවිඩ් (COVID) වසංගත තත්ත්වය හේතුවෙන් එකල්හි බලපැවැත්වූ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව පුහුණු අවස්ථාවන් සඳහා නිලධාරීන් පුහුණු සඳහා යොමු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදි. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාචන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. | පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සඳහා ලබාදී ඇත්තේ ව්‍යාචන මටටමේ හෝ අහිතකර මටට්මේ මතයක් නොව තත්ත්වාගණනය කළ මතයකි. |
| උපරිම සේවා කාලය සම්පූර්ණ කරනලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ තැම්පත් ගිණුමෙහි පැවති වෙනස හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පැවති වෙනස, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේ දී සිදු වී ඇති අතපසුවීමක් වු අතර 2022 වර්ෂයේ දී මෙවැනි වැරදි වලින් තොරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරන ලදි. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>**පළමු කොටස : 60.00** | |
|---|---|
| කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග | කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
| ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2021 අංක 8.1 හා 2013.07.12 දිනැති චක්‍රලේඛය මගින් CIGAS පද්ධතිය මගින් පිළියෙල කරනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම ප්‍රමාණවත් බවට උපදෙස් ලබා දී ඇති බැවින් ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල 25 සඳහාම අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගනු ලැබේ. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණු බව පිළිගනිමි. දිවයින පුරා විසිරී පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 562කින් හා දිස්ත්‍රික් කාර්යාල 25 මගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මහජනතාවට සේවා සපයනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන අදාළ දිස්ත්‍රික්කයේ විගණන අධිකාරී මගින් විගණනය කර විගණන විමසුම් ඉදිරිපත් කරනු ලබයි. මෙයට අමතරව ප්‍රධාන කාර්යාලයේ රජයේ විගණන අංශය මගින් ද අදාළ දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන විගණනය කර විගණන විමසුම් යොමු කරනු ලැබේ. මෙසේ ඉදිරිපත් කරන සියලු විගණන විමසුම් වෙනුවෙන් අදාළ පැහැදිලි කිරීම් දිස්ත්‍රික් කාර්යාල හා අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් ලබාගෙන අවසාන පිළිතුර ගොනු කළ යුතු වේ.<br><br>සමහර විගණන විමසුම් සඳහා අවශ්‍ය වන පැහැදිලි කිරීම් ලබාගනිමින් අවසාන පිළිතුරු සකස් කිරීම ලබා දී ඇති කාලය තුළ ඉටු කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි අතර, එබැවින් පිළිතුරු සැපයීම ප්‍රමාද වන අවස්ථා දක්නට ලැබුණි.<br><br>කෙසේ වෙතත් මේ වන විට අවසන් පිළිතුරු ලබා දීමට ප්‍රමාද වී ඇති විගණන විමසුම් සඳහා අදාල පිළිතුරු සකස් කරමින් පවතින අතර, කඩිනමින් පිළිතුරු ලබා දීමට ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව දන්වමි.<br><br>ඉදිරියේ දී මෙවැනි ගැටළු අවම කර ගනිමින් අවසන් පිළිතුරු සකස් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර, එය ක්‍රියාත්මක වන බව දන්වමි. |

එල්.ඒ.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල

ජනක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අත්සනින් නිකුත් කරන අභ්‍යන්තර විගණන වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ගනුලබන ක්‍රියාමාර්ග දින 14 ඇතුලත ඉදිරිපත් කරන ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරල්ගේ අත්සනින් දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් වෙත දන්වා ඇත. මෙම අභ්‍යන්තර විගණන වාර්තාව දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වෙත ලැබීමෙන් පසු වාර්තාවේ අඩංගු කරුණු පිළිබඳ පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා එම වාර්තාව අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන භාර ගොවිජන සංවර්ධන නිලධාරීන් වෙත යොමු කරනු ලැබේ.<br><br>එම වාර්තාව සඳහා ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන පිළිතුරු දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්ගේ නිරීක්ෂණද ඇතුලත් කර ඔවුන්ගේ අත්සනින් පිළිතුරු ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය මාසයකට වැඩි කාලයක් ගතවන බවත්, එම තත්ත්වය වලක්වා ගැනීමට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී හා ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී අවධානය යොමු කරන බවද දන්වා සිටිමි. |
| මු.රෙ.134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අත්සනින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවේ පිටපත ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ආවරණ ලිපිය සමගින් විගණකාධිපති වෙත ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| 2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මිලදී ගන්නා වත්කම් පිළිබද තොරතුරු 2021.12.31 වන දින ක්‍රොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර අපහරණය පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමට අදාළ උපදෙස් ක්‍රොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මගින් ලබාදෙන බව දන්වා ඇතත් මෙතෙක් අදාළ උපදෙස් ලැබී නොමැති අතර, උපදෙස් ලද වහාම අදාල තොරතුරු ක්‍රොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ සියලුම භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023.03.17, 2023.04.03 සහ 2023.05.10 දිනයන්හි විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත (1/2020 චක්‍රලේඛ කාල රාමුව තුළ) |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌණතා අතිරික්තතා පිළිබඳ නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර 2023 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීම් අවසන් කර ඇත.<br>2023 වර්ෂයේ 1/2020 චක්‍රලේඛ කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට අපේක්ෂිතය. |
| සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාලව කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි වී ඇති වාහන ගණන 142ක් වන අතර, වාහන 10කට අදාලව ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් නොමැති බැවින් ඒ සම්බන්ධව මුල් පිටපත් ලබා ගැනීම සඳහා අංක 7/4/1/වාහන ගැටළු හා 2024.01.01 දිනැතිව කුරුඳුවත්ත පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, පැමිණිලි පිටපතක් රැගෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර වාහන ලියාපදිංචි සහතිකවල අනුපිටපත් ලබා ගැනීමට කටයුතු සිදු කරනු ඇත.<br>එමෙන්ම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි වී නොමැති වාහන 15ක් පවරා ගැනීම සඳහා (දැනට ඇවර කර ඇති ආයතන) 2018.10.10 දිනැති 03/2018 වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අනුව පවරා ගැනීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් සිදු කර ගැනීමට හැකි බැවින් එම වාහන 15 සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. අදාල උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සංචිත වාහන සඳහා අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එළැබෙන මාසයේ 15 වන දිනට පෙර විගණන අංශය වෙත ඉදිරිපත් කරන අතර ,මේ වන විට විගණන අංශය වෙත ලබාදීමට ඇත්තේ 2023 දෙසැම්බර් මස දෛනික ධාවන සටහන් පමණි.එම මාසික සාරාංශ වාර්තාද ලබාදීමට කටයුතු කරනු ලැබේ. |
| සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු වාහනවල රාජ්‍ය ලාංඡනය සහිත ස්ටිකර් අලවා තිබූ අතර, කාලයාගේ ඇවෑමෙන් එම ස්ටිකර් දුර්වර්ණ වී මැකී ගොස් ඇත. මේ වන විට රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සිදු කරනු ලැබේ. |
| වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි. | වාහන 13ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු අවසන් කර ඇති අතර, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාලව කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි වී ඇති වාහන 10ක් සම්බන්ධයෙන් ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් නොමැති බැවින් අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව අදාල වාහනවල මුල් පිටපත් ලබා ගැනීම සඳහා අංක 7/4/1/වාහන ගැටළු හා 2024.01.01 දිනැතිව කුරුඳුවත්ත පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, පැමිණිලි පිටපතක් රැගෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර වාහන ලියාපදිංචි සහතිකවල අනුපිටපත් ලබා ගැනීමට කටයුතු සිදු කරනු ඇත. |

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

එච්.එම්.එස්. කුමාර
ප්‍රධාන මුල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| | එමෙන්ම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි වී නොමැති වාහන 15ක් පවරා ගැනීම සඳහා (දැනට ඈවර කර ඇති ආයතන) 2018.10.10 දිනැති 03/2018 වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අනුව පවරා ගැනීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් සිදු කර ගැනීමට හැකි බැවින් එම වාහන 15 සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. අදාල උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.<br><br>ඒ අනුව, අදාල ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව 2024 වර්ෂයේ වාහන අපහරණය කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර විධිමත් සැලැස්මක් සකස් කර ඇත. |
| සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | මේ වන විට වාහනවල ලොග් පොත් යාවත්කාලීන කර ඇත. |
| රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු:රෙ 103 ,104 ,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | පහත සඳහන් වාහනවල මු:රෙ 103 ,104 ,109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත.<br><br>**53-9816** - මෙම අනතුරට අදාළව පුත්තලම දිසා අධිකරණයෙහි පැවති අංක 2704/එම් දරන නඩුව 2021.02.18 වන දින අවසන් වී ඇති අතර අලාභ වශයෙන් දෙපාර්තමේන්තුව විසින් ගණනය කර ඇති රු.149,750.00 මුදල කුවිතාන්සි අංක A/24 716613 හා 2021.02.16 දිනැතිව පුත්තලම ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත නඩුවේ විත්තිකරු වන සෙයිනුල් ආබ්දීන් මොහොමඩ් සියාද් යන අය විසින් ගෙවා ඇත.<br><br>**56-8055**- මෙම අලාභය අය කර ගැනීමට ප්‍රමාණවත් ලියකියවිලි දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් අදාළ නඩුවේ නඩු තීරණය විමසා කටයුතු කිරීමට නියමිතය<br><br>මෙම නඩුව අවසානයේ ලද තීරණය හා අනතුරේ අලාභය වගකිව යුතු රියදුරන්ගෙන් අය කරගෙන ඇද්ද යනත් දන්වන ලෙස 2023.05.02 දින ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් , රත්නපුර වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති අතර, එයට පිළිතුරු වශයෙන් අදාළ නඩුවේ තීන්දු පිටපතක් ලබා ගැනීම සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, රත්නපුර විසින් ඇඹිලිපිටිය ගරු මහේස්ත්‍රාත් වෙත යවන ලද 2023.06.26 දිනැති ලිපිය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව ලද වහාම ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.<br><br>**PB-5280** - මෙම අනතුර වළක්වා ගත නොහැකි රිය අනතුරක් බැවින් අලාභය රජයට සිදු වූ පාඩුවක් ලෙස නිගමනය කර ඇත. එබැවින් මු.රෙ.109 යටතේ අලාභය පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරනු ලැබේ. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර ...ංශය
කෘෂිකර්ම අමාත්‍ය...
අංක.80/5,"ගොවිජන ...
රජමල්වත්ත පටුමග, ...

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| | **250-2078** - 2015.11.24 දිනැති ලිපියට අනුව අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙතින් මු.රෙ.104 (3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භන වාර්තාව හා මු.රෙ. 104 (4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව ලබා දී ඇත.<br><br>මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මු.රෙ. 109 යටතේ අලාභය පොතෙන් කපා හැරීම සඳහා වන ලියකියවිලි සකසා කටයුතු කර ඇත.<br><br>**53-9830**- මේ සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව මඟින් වන්දි නඩුවක් පැවරීමට අවශ්‍ය කටයුතු ඉටුකර දෙන මෙන් ඉල්ලා 7/1/2/32/1 හා 2013.12.12 දින ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල) විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර (ඇමුණුම 10 ) ඒ අනුව කුරුණෑගල දිසා අධිකරණයේ නඩු අංක 15/MD මඟින් මෙම අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර ඇත.<br><br>කුරුණෑගල දිසා අධිකරන නඩු අංක 15 / MD නඩුවේ දෙවන විත්තිකරු වන සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම විසින් රු.51,750 ගෙවීමට එකඟවී ඇති අතර එම මුදල ලබාගෙන නඩුව අවසන් කිරීමට එකඟතාව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පල කර ඇති බැවින් මේ වන විට අදාල නඩුව අවසන්ව ඇත.<br><br>අනෙකුත් අනතුරු ලිපි ගොනුවල අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරික්ෂාවන් කර නොතිබුණි. | 2022 ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීම සඳහා විධිමත් මණ්ඩලයක් පත් කල ද, එකල රටෙහි පැවති ඉන්ධන හිඟය නිසා ඉන්ධන දහන පරික්ෂාව විධිමත්ව සිදු කර ගැනීමට නොහැකි විය. මෙම වසරේ දී ඉන්ධන දහන පරීක්ෂාව විධිමත්ව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. 2024 වර්ෂයේ වාහන 12ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇත. |
| බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | 2021.12.31 දිනට හඳුනා නොගත් ලැබීම් හා හඳුනා නොගත් ගෙවීම් මු.රෙ.396 ප්‍රකාරව කොටසක් නිරවුල් කර ඇත. තවදුරටත් නිරවුල් කිරීමට ඇති වටිනාකම හඳුනා නොගත් ලැබීම් හා හඳුනා නොගත් ගෙවීම් ප්‍රමාණයක් නිරවුල් කිරීමට ඇත.. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.



ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇති කරගෙන තිබුණි. නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත. | මු.රෙ.94 (1) ප්‍රකාරව තවදුරටත් වැය විෂයන්හි ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇති කරගෙන නොමැත. |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමා ඉක්මවීම් පිළිබඳ ආවරණ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ අත්තිකාරම් බී ගිණුම් සීමා ඉල්ලුම් කිරීමේ දී දෙපාර්තමේන්තුව විසින් හඳුනාගන්නා ලද අවම ලැබීම් සීමාව රු.මි.200 ලෙස ඉල්ලුම් කළද, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රු.මි.290ක් අනුමත කර තිබුණි.<br><br>අවම ලැබීම් සීමාව රු.මි.290ක් ළඟා කර ගත නොහැකි බැවින් 2021 දෙසැම්බර් මස එම සීමාව රු.මි.250ක් ලෙස සංශෝධනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. ඒ අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අවම ලැබීම් සීමාව රු.මි.250ක් ලෙස සංශෝධනය කර අංක BD/AA/LR/01/2022 හා 2021.12.31 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී තිබුණි. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | කල් ඉක්ම වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා අදාල පාර්ශව හා ආයතන දැනුවත් කර ලිපි යොමු කර ඇති අතර, සැලකිය යුතු ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම මූලාශ්‍ර හඳුනා ගත නොහැකි හෝ කිසිසේත්ම අයකර ගත නොහැකි ණය ශේෂ කපා හැරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. |
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් ලැබීම් අනුව ප්‍රමුඛතා පදනමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින අතර, අක්මුදල් ලැබීම් අනුව ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි. | ➢ 2019 කාර්යසාධන වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් මුද්‍රණය කර පිටපත් 12කින් යුක්තව 2023.11.27 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br><br>➢ 2020,2021 හා 2022 වර්ෂවල කාර්යසාධන වාර්තාවන් අමාත්‍යාංශ අනුමැතියට ඉදිරිපත් කර ඇත.<br><br>➢ 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පිළියෙළ කිරීමට කරුණු ගොනු කර ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අංක 30/94 හා 1994.04.20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 5.1 විධිවිධාන ප්‍රකාරව විදේශාධාර ලබන ව්‍යාපෘතිවල වියදම් අදාල ශීර්ෂය, වැඩසටහන, ව්‍යාපෘතිය හා වැය සංකේතය යටතේ මාසික ගිණුම් සාරාංශ මගින් හා මාරු නියෝග මගින් භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇත.<br><br>තවද, 2021.12.31 දිනට වියදම් නොවී ඉතිරි වූ මුදල් වර්ෂ අවසාන ගිණුම් පියවීමේ දී භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.



ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| දෙවන කොටස : 48.00 | |
|---|---|
| ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි. | ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛනයක් පවත්වා ගැනීමේ ක්‍රමවේදයක් මේ වන විට සකසමින් පවතින අතර, මේ වන තෙක් ඉල්ලා සිටිනු ලැබූ තොරතුරු සම්බන්ධව අතපසුවීමකින් තොරව ලබා දීමට කටයුතු කර ඇත. |
| ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | ➢ මෙම දෙපාර්තමේන්තුවේ නිලවෙබ් අඩවිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රහය ඇතිව සකසන ලද අතර, වෙබ් අඩවිය නිර්මාණය කිරීමේදී එහි සාමාන්‍ය තොරතුරු යාවත්කාලීන කිරීමට පමණක් සැලසුම් කර ඇත.<br>➢ විගණක විසින් දක්වා ඇති විගණන කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් හා කාලයක් වැය වන බැවින්,www.agrariandepat.lk දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කරන ලද සබැඳියක් මඟින් www.agrarian.lk වෙබ් අඩවියෙහි විවෘත වන වෙබ් පිටුවක මහජනතාවට තම අදහස් පල කිරීමට පහසුකම් සලසා ඇත.<br>➢ තවද අල්ලස් හා දූෂණ ක්‍රියාවන් සම්බන්ධව මහජනයාට පැමිණිලි කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පිවිසුම ඉදිරිපිට මහජන පැමිණිලි බහාලුමක් තබා ඇත . |
| පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා අදාල තොරතුරු දෙපාර්තමේන්තුවේ අංශ වෙතින් ගොනු කරමින් පවතින අතර, කඩිනමින් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |
| මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාක් සහතික කර නොතිබුණි. | 2020 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු පුහුණු අංශය විසින් සකස් කල 2021 -ක්‍රියාත්මක සැලැස්ම මඟින් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 785 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 11 ක් (ඇස්තමේන්තුගත මුදල රු.3,000,000.00) සැලසුම් කර තිබූ අතර 2021 ක්‍රියාත්මක සැලැස්මේ ඇති පුහුණු වැඩසටහන් 05ක් ඉවත් කර 2021- ක්‍රියාත්මක සැලැස්මේ නොමැති එහෙත් සේවා අවශ්‍යතාව හා නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි ප්‍රමුඛතාවය ලබාදිය යුතු පුහුණු වැඩසටහන් 06ක් පවත්වා ඇත. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මුල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.



ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

## 2021 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මේ සාරාංශය

| විස්තරය | පුහුණු වැඩසටහන් ගණන | ඇස්තමේන්තුගත පිරිවැය (රු) | සත්‍ය පිරිවැය (රු) | ඉලක්කගත සහභාගීත්වය | සත්‍ය වශයෙන් සහභාගි වූ ගණන |
|---|---|---|---|---|---|
| 2021 ක්‍රියාත්මක සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් | 11 | 3,000,000.00 | - | 785 | - |
| (-) 2021 ක්‍රියාත්මක සැලසුමෙන් ඉවත් කල පුහුණු වැඩසටහන් | (05) | (1,050,000.00) | - | (300) | - |
| 2021 ක්‍රියාත්මක සැලැස්මට අනුව සිදුකල පුහුණු වැඩසටහන් | 06 | 1,950,000.00 | 1,361,770.00 | 485 | 306 |
| (+) 2021 වර්ෂයේ අළුතින් කල පුහුණු වැඩසටහන් | 06 | | 1,963,075.50 | - | 190 |
| 2021 වර්ෂය තුල කල පුහුණු වැඩසටහන් | 12 | | 3,324,845.50 | | 496 |

ඒ අනුව 2021 වර්ෂය අවසානයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් නිලධාරින් 496 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 12ක් පවත්වන ලදී.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

| | |
|---|---|
| සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | මාගේ අංක 7/2/2/5/1/3(IV) (තාව) හා 2022.04.07 දිනැති ලිපිය මගින් සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත එක් එක් වර්ෂයේ සෑම වර්ෂයකදීම මාර්තු 31 දිනයේ පැවති තමාගේ වත්කම් බැරකම් ප්‍රකාශ වාර්ෂිකව ලබා දිය යුතු බවත් එම වත්කම් බැරකම් ප්‍රකාශ අදාල වර්ෂයේ ජූනි මාසයේ තිස්වන දිනය වන විට ලබා දිය යුතු බව දැනුවත් කර ඇත. 2024 වර්ෂයේ අදාල චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරව සියලු වත්කම් බැරකම් ප්‍රකාශ යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. |
| නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156 (1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩුවලට අදාලව රු.71,321,516.57ක මුදලක් අයවිය යුතුව පවතින අතර,ඉන් රු.43,876,127.74ක මුදලක් දෙපාර්තමේන්තුව මගින් අයකර ගැනීමටත් රු.27,445,388.83ක මුදලක් නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතී. |
| උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබිණි. | • 2020 වර්ෂයේදී රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේදී වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී.<br><br>• 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදයත් සමඟ නිලධාරීන් වෙත ස්ථාන මාරු සිදු කිරීමේදී නිලධාරීන් වෙත මුහුණ පෑමට සිදුවන අපහසුතාවයන් හේතු කොට ගෙන ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සිදු නොකරන ලදී.<br><br>• දෙපාර්තමේන්තුවට අනුයුක්තව දීර්ඝ කාලයක් එකම දිස්ත්‍රික් කාර්යාලයක් තුල, ගොවිජන සේවා මධ්‍යස්ථානයක් හෝ කෘ.ප.නි.ස වසමක් තුල සේවය කරන ගොවිජන සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී සේවය, මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, කම්කරු, මුරකරු යන තනතුරු සඳහා 2023.05.02 දින අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියක් සකසා ක්‍රියාත්මක කර ඇත.<br><br>• 2023 වර්ෂයේදී නිලධාරීන් ස්ථාන මාරු කිරීම් සිදු කරන ලද අතර 2024 වර්ෂයේදී වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් සඳහා නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවන ලෙස සියළුම දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත.<br><br>• එමෙන්ම, 2024 වර්ෂයේ ද එම ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. |

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මුල්‍ය නිලධාරී-පොහොර අංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ඇමුණුම් අංක : 01

| | මුළු නිලධාරීන් ගණන | මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | විශ්‍රාම වැටුපක් රහිත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | වැටුප් සහිත විදේශගත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | මධ්‍යගත කිරීම යටතේ මාරු කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරීන් ගණන | රු. | නිලධාරීන් ගණන | රු. | නිලධාරීන් ගණන | රු. | නිලධාරීන් ගණන | රු. | නිලධාරීන් ගණන | රු. | නිලධාරීන් ගණන | රු. | නිලධාරීන් ගණන | රු. | රු. |
| 2022.05.17 දින 2022 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අදාලව ණය ශේෂය | 154 | 20 | 2,211,596.30 | 85 | 6,435,977.50 | 7 | 126,087.00 | 4 | 20,832.15 | 31 | 1,656,432.48 | 3 | 218,495.60 | 4 | 143,392.00 | **10,812,813.03** |
| 2024.01.31 දක්වා අයවීම් | 104 | 9 | 1,196,316.43 | 78 | 6,060,300.50 | 4 | 115,287.00 | 3 | 18,832.15 | 9 | 656,211.48 | 0 | - | 1 | 59,377.00 | **8,106,324.56** |
| 2024.01.31 දිනට ශේෂය | 50 | 11 | **1,015,279.87** | **7** | **375,677.00** | **3** | **10,800.00** | **1** | **2,000.00** | **22** | **1,000,221.00** | **3** | **218,495.60** | **3** | **84,015.00** | **2,706,488.47** |